**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය - 2017**

---

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 23(2) වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2018 ජුනි 19 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ රු.2,357,890 ක අධිකාරිය සතුව පැවති අස්පෘශ්‍ය වත්කම්වලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ප්‍රමිතයේ 132 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3

ප්‍රමිතයේ 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි, එම වැරදි සිදුවූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවත්, ඉකුත් වර්ෂයේදී ගොඩනැගිලි හා සවිකිරීම් ක්ෂය රු.34,013 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ සමුච්චිත ලාභයට හා 2017 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය වෙන්කිරීම් ගිණුමට පමණක් ගැලපීම් කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

(i) ප්‍රමිතයේ 25 ඡේදය ප්‍රකාරව, අධිකාරිය පිහිටුවීමේදී සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශයෙන් ලැබුණු ජංගම නොවන වත්කම් සාධාරණ අගයට ගිණුම්ගත කරනු වෙනුවට එම වත්කම්වල පිරිවැය රු.6,369,803 ක් 2016 ජනවාරි 01 දින අධිකාරිය විසින් ප්‍රාග්ධනගත කර තිබුණි. තවද එම වත්කම් විධිමත් ලෙස පවරා ගෙන නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව වන අතර වත්කමක් භාවිතයෙන් ඉවත්කළ පසුව ක්ෂය කිරීම නවතා දැමිය යුතුය. නමුත් ඊට පටහැනිව වත්කම් මිලදී ගත් වර්ෂය සඳහා ක්ෂය කිරීමටත් ඉවත් කරන වර්ෂයේ ක්ෂය නොකිරීමටත් ප්‍රතිපත්තියක් හඳුනාගෙන තිබුණි. එලෙස වත්කම් මිලදීගෙන පාවිච්චියට ගත් දිනය නොසලකා සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂය කිරීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ක්ෂය පිළිවෙලින් රු.837,624 කින් හා රු.399,748 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ප්‍රාග්ධන වියදම් සඳහා ලැබෙන රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ආයතනය විසින් හඳුනාගෙන තිබුණු ප්‍රතිපත්තිය ප්‍රකාරව, වත්කම්වල ඵලදායී ජීවකාලය පදනම් කර ගනිමින් වාර්ෂිකව ක්ෂය කරනු ලබන ප්‍රමාණයට සමාන ප්‍රමාණයකින් එක් එක් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කරනු ලබන බව දක්වා තිබුණද, රාජ්‍ය ප්‍රදාන මත අත්පත් කර ගෙන තිබුණු වත්කම් සඳහා ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර තිබුණු වාර්ෂික ක්ෂය ප්‍රමාණයට සමාන ප්‍රමාණයකින් රාජ්‍ය ප්‍රදාන ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය පිළිවෙලින් රු.4,043,243 කින් හා රු.8,782,878 කින් වැඩියෙන් දක්වා තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත පරිදි විය.

| නීති,රීති හා රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වගන්තිය හා 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනතේ 44 වගන්තිය | ජීවන වියදම් දීමනාව අදාළ කර නොගෙන සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය හා සේවක භාරකාර අරමුදල් දායකත්වය ගණනය කර තිබීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය පිළිවෙලින් රු.28,704 ක් හා රු.46,696 ක් සේවකයින්ගේ වැටුපෙන් අඩු කර නොතිබුණි. එසේම සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට සේවා යෝජක දායකත්වය ඉකුත් වර්ෂයේදී පිළිවෙලින් රු.71,760 ක් හා රු.10,764 ක්ද, සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.116,740 ක් හා රු.17,511 ක්ද වශයෙන් අඩුවෙන් දායක වී තිබුණි. |
| (ආ) | 1983 අංක 12 පාරිතෝෂික ගෙවීම් පනතේ 20 වගන්තිය | පනතේ 20 වගන්තිය ප්‍රකාරව වැටුප හෝ වේතන යන්නට අයත් නොවන ගැලපුම් දීමනා හා විශේෂ දීමනා ඇතුළත් කරමින් පාරිතෝෂික ගණනය කර තිබුණි. ඒ හේතුවෙන් ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.19,762 ක් හා රු.120,255 ක් වැඩියෙන් පාරිතෝෂික වෙන් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක්, තම පාලක මණ්ඩලවල අනුමැතිය ඇතිව සිය සේවකයින්ට ගෙවිය හැකි වුවද, අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාරය විසින් අනුමත කර නොතිබුණු රු.10,000 ක මාසික දීමනාවක් අධිකාරියේ ගණකාධිකාරිවරිය වෙත 2016 ඔක්තෝබර් සිට 2017 සැප්තැම්බර් දක්වා කාලය තුළදී ගෙවා තිබුණි. එසේ ගෙවා තිබුණු මුළු මුදල රු.120,000 ක් විය. |

## 3. මූල්‍ය සමාලෝචනය
------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.12,478,615 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.5,625,716 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,852,899 ක අඩුවීමක් දක්නට ලැබුණි. සේවක පාරිශ්‍රමික, කොන්ත්‍රාත්තු සේවා හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

එහෙත් මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී ඉකුත් වර්ෂයේ රු.2,155,505 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.1,841,196 ක් දක්වා පහත වැටී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 4.1 කාර්යසාධනය
------------------

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය
--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ආකෘතියට අනුකූල වන ලෙස සමාලෝචිත වර්ෂයේ ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණු බැවින් අධිකාරියේ ප්‍රගතිය පිළිබඳ නිසි සමාලෝචනයක් කළ නොහැකි විය.

(ආ) 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 14 වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් ඉටුකළ යුතු පහත සඳහන් කර්තව්‍යයන් ඉටු කර ගැනීමට හෝ ඒ සඳහා සැලසුම් පිළියෙල කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(i) අනිසි ඖෂධ භාවිතය වැලැක්වීම හෝ අවම කිරීම සඳහා ජාතික අන්තරායකාරී ඖෂධ පාලක මණ්ඩලය විමසා වැඩ පිළිවෙලවල් සකස් කිරීම.

(ii) දුම්කොළ හා මද්‍යසාර සම්බන්ධව සියළු විමර්ශන සහ අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය සමීක්ෂණය කිරීම සහ මද්‍යසාර සහ දුම්කොළවලට සම්බන්ධ ගැටළු පිළිබඳව දේශීය, කලාපීය සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගීතාවය ගොඩනගා ගැනීම.

(ආ) අධිකාරිය විසින් ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටුකළ යුතු කර්තව්‍යයන් ඉටු නොකිරීම නිසා රු.12,300,000 ක ප්‍රතිපාදන හා අනු ක්‍රියාකාරකම් 12 ක් සඳහා ඇස්තමේන්තු කර තිබුණු රු.34,000,000 කින් රු.11,830,000 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. ඊට අමතරව අනු ක්‍රියාකාරකම් දෙකක ප්‍රතිපාදන ඉක්මවා රු.526,721 ක් වැය කර තිබුණි.

## 4.2 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

අධිකාරියට කාර්යාලීය පරිශ්‍රයක් ඉදිකිරීම සඳහා 2009 – 2012 කාල පරිච්ඡේදය තුළදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් වෙන්කරදී තිබුණු ඉඩම ප්‍රයෝජනයට නොගැනීම නිසා එම ඉඩම වෙනත් ආයතනයකට පවරා තිබුණි. ඒ අනුව අධිකාරියේ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැරව හා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුවකින් තොරව නාගරික සංවර්ධන අධිකාරියේ පරිපාලිත සමාගමකින් කුළී පදනම මත ගොඩනැගිල්ලක් ලබාගෙන තිබුණි. එම ගොඩනැගිල්ලේ වර්ෂ දෙකෙන් දෙකට බදු කුළී අනුපාත වෙනස් කරමින් අදාළ සමාගම සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණු අතර ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු බදු කුළිය පිළිවෙලින් රු.7,888,407 ක් හා රු.8,443,954 ක් විය.

## 5. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

-----------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.